# අනුකූලතා තක්සේරු පිළිබඳ

# ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

2011

## වාර්ෂික වාර්තාව

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

# පටුන


| | පිටු අංකය |
|---|---|
| 1. හැඳින්වීම | 2 |
| 2. තත්ව ප්‍රතිපත්තිය | 3 |
| 3. දැක්ම, මෙහෙවර හා අරමුණු | 4 |
| 4. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනත, ක්‍රියාකාරකම් හා උපායමාර්ග | 5 |
| 5. සභාපතිතුමාගේ පණිවිඩය | 6 |
| 6. අධ්‍යක්ෂ/ප්‍රධාන විධායකගේ විග්‍රහය | 9 |
| 7. පාලක සභාව | 14 |
| 8. කළමණාකරණය, කමිටු හා මණ්ඩලයේ කාර්ය මණ්ඩලය | 15 |
| 9. ක්‍රියාකාරකම් | 18 |
| 10. 2011 කාර්ය සාධනය | 22 |
| 11. ජාත්‍යන්තර ජයග්‍රහණ හා සිදුවීම් | 23 |
| 12. හැකියා වර්ධණ හා පුහුණු වැඩසටහන් | 24 |
| 13. 2011 මූල්‍ය කාර්යය සාදනය | 25 |
| 14. 2011 මූල්‍ය ප්‍රකාශන | 26 |
| 15. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් | 29 |
| 16. විගණකාධිපතිගේ නිරීක්ෂණ | 38 |
| 17. විගණකාධිපතිගේ නිරීක්ෂණ සම්බන්ධ සභාපතිගේ අදහස් දැක්වීම | 45 |
| 18. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩයේ ප්‍රතීතන ලාංඡනය | 48 |
| 19. සංවිධාන ව්‍යුහය - ඇමුණුම II | 53 |
| - ඇමුණුම III | 54 |
| 20. ප්‍රතීතනය කරන ලද අනුකූලතා තක්සේරු ආයතන - 2011 | 55 |

| | |
|---|---|
| **හැඳින්වීම** | 2005 අංක 32 දරණ අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය, ශ්‍රී ලංකාව සඳහා වන ප්‍රතීතන අධිකාරිය වේ. මෙම මණ්ඩලය තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර සාමාජිකයින් දහතුන් දෙනෙකුගෙන් (13) යුත් පාලක සභාවක් මඟින් පාලනය වේ. ප්‍රතීතන මණ්ඩලයේ ප්‍රධාන විධායක සහ මහා මණ්ඩල ලේකම්වරයා වන්නේ අධ්‍යක්ෂකවරයාය.<br><br>රටේ ජාතික තත්ව යටිතල පහසුකම් සම්පූර්ණකිරීම, තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය පිහිටු වීමේ අවශ්‍යතාවය ඇතිවිය. භාණ්ඩ හා සේවා සම්බන්ධ ජාතික හා අන්තර් ජාතික වෙළඳාම පහසුකිරීමට සහායවීමක් වශයෙන් ඒ සඳහා බලපාන තීරුබදු නොවන අනෙකුත් සියලු බාධක මෙමගින් ඉවත් කළ හැකිය. මේ සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් අනුකූලතා තක්සේරු ආයතන වන පරීක්ෂණ හා ක්‍රමාංකන රසායනාගාර, සෝදිසිකිරීමේ ආයතන හා සහතික කිරීමේ ආයතන ප්‍රතීතනය කරනු ලබයි. ජාතික තත්ව යටිතල පහසුකම්වලට අදාල අනෙකුත් ආයතන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව හා නියාමන ආයතනයයි.<br><br>නියාමන ආයතන, මහජන සෞඛ්‍ය, වෘතීයමය ආරක්ෂාව, පරිසර ආරක්ෂාව, වංචා වැලැක්වීම්, සාදරණ වෙළඳාම සම්බන්ධයෙන් දැඩි වගකීමට යටත්වනු ඇත. ප්‍රතීතන සේවාව, පාරිභෝගික ඉල්ලුම හා ඇල්මක් දක්වන පාර්ශවය හා බලපෑම් කරන කොටස්වල මැදිහත්වීම මත ස්වේච්ඡාවෙන් සිදුවන කටයුත්තක් බැවින් මේ සම්බන්ධ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පසුවිපරම ඉතා වැදගත් වේ. ප්‍රතීතන සේවා, නිෂ්පාදන හා සේවා සැපයුම් වෙනුවෙන් ආදලවීම සඳහා නිෂ්පාදකයින් හා සේවා සපයන්නන් අදල ප්‍රමිති හා අනුකූලතා තක්සේරු පිළිවෙත් සමඟ අනුකූල විය යුතුය. (මෙම තුන්වන පාර්ශව තහවුරුව ශ්‍රී ලංකා ප්‍රමිති අනුගමනය කිරීම තුලින් තහවුරු කරනු ලබයි.)<br><br>මෙම සම්පූර්ණ යාන්ත්‍රණය මගින් අනුකූලතා තක්සේරුවල |

| | |
|---|---|
| | අපක්ෂපාතීබව, නිපුනත්වය හා විශ්වාසවන්තබව තහවුරු කරනු ලබයි. මෙම අනුකූලතා තක්සේරු මූලධර්මවලට හා පිළිවෙත්වලට සිදුකිරීම අත්‍යාවශ්‍යය වේ. මෙමගින් භාණ්ඩ හා සේවා වෙළඳපොළට ඇතුළුවීමට හා සදරණ වෙළඳාම වෙනුවෙන් විශාල පිටුවහලක් ඇතිකරනු ලබයි.<br><br>ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය දැනට නො.546/4, ගාලුපාර කොළඹ 03 යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබයි. එහි දුරකතන අංක හා ඊමේල් හා වෙබ් අඩවි අංක පහත පරිදි වේ.<br>දුරකථන: 0112372638 /9, අධ්‍යක්ෂ: 0112372680,<br>ෆැක්ස්: 0112372629,<br>ඊමේල්: slabmail@slab.lk වෙබ් අඩවිය: www.slab.lk |
| **තත්ව ප්‍රතිපත්තිය** | ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය එහි සේවාලාභීන්ට උපරිම අවංකභාවයෙන් හා කාර්යක්ෂමතාවයෙන් ප්‍රතීතන සේවා ලබාදීමට බැඳී ඇති සේවා සලසන ආයතනයක් විය යුතුය.<br><br>ගනුදෙනුකරුවන් හා ඇල්මක් දක්වන පාර්ශවවල සහ ව්‍යාපාරික පරිසරයේ වෙනස්වන අවශ්‍යතා සැළකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ජාත්‍යන්තර ප්‍රමිති හා ප්‍රතිපත්තිවලට අනුව ප්‍රතීතන සේවා ලබාදීමට බැඳී සිටී.<br><br>ජාත්‍යන්තර පිළිගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර ආයතන සමග ඵලදායිලෙස කටයුතු කිරීමට ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය බැඳී සිටී.<br><br>ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ක්‍රියාකාරකම් ඉහළම වෘතීය මට්ටමින් ලබාදීම සඳහා මණ්ඩලයේ සේවකයින් හා තක්සේරුකරුවන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා උචිත පරිසරයක් නිර්මාණය කරන අතර එමගින් ඔවුන්ගේ ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනේ.<br><br>අනුකූලතා තක්සේරු හා ප්‍රතීතන සේවා සම්බන්ධව පරිසරයේ ඇති ඉල්ලුම හා අවශ්‍යතාවලට අදල වැඩිදියුණු කිරීම් සඳහා වන වෙනස්කිරීම් වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය නිරතුරුව එහි ක්‍රියාකාරිත්වය සමාලෝචනයට භාජනය කරනු ලබයි. |

| | |
|---|---|
| **දැක්ම** | "කළාපයේ ප්‍රමුඛතම ප්‍රතීතන ආයතනය බවට පත්වීම උදෙසා සේවා සැලසීමතුළින් නිෂ්පාදන හා සේවාවන් සඳහා දේශීය හා ජාත්‍යන්තර පිළිගැනීම ලබාගැනීම හා අනුකූලතා තක්සේරු පිළිබඳ ප්‍රතීතන ලබාදීමේදී කර්මාන්ත හා වාණිජ ක්ෂේත්‍රයන් තුල හා රාජ්‍ය හා පොදු මහජනතාවගේ වෙනස්වන අවශ්‍යයතා සඳහා නවතාවයකින් යුතුව කටයුතු කිරීම" |
| **මෙහෙවර** | "ජාත්‍යන්තර පිළිගැනීමක් සහිතව ප්‍රතීතන සේවාවන් සැපයීම ප්‍රවර්ධනය කිරීම හා දේශීය හා විදේශීය වෙළඳ පොළ සඳහා භාණ්ඩ හා සේවාවන් සැපයීමේදී අනුකූලතා තක්සේරු කිරීම පහසු කිරීම" |
| **අරමුණු** | මණ්ඩලයේ ප්‍රධාන කර්තව්‍යයන් නිශ්චිත අරමුණු ලෙස පහත සඳහන්කර ඇත.<br>• ජාත්‍යන්තර ප්‍රමිත ISO/IEC 17011 ට අනුකූලව පද්දතීන්ට ස්ථාපිත කිරීම, සංවර්ධනය කිරීම, කළමණාකරණය හා ක්‍රියාත්මක කිරීම පහසු කිරීම.<br>• ISO /IEC 17025 පදනම්කරගෙන පරීක්ෂණ හා ක්‍රමාංකණ රසායනාගාර සඳහා ප්‍රතීතන වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම හා ප්‍රවර්ධනය කිරීම.<br>• ISO 15189 පදනම්කරගෙන වෛද්‍ය/චිකිත්සාගාර රසායානාගාර සඳහා ප්‍රතීතන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.<br>• ISO /IEC 17021 පදනම්කරගෙන පද්ධති සහතික කිරීමේ ආයතන සඳහා ප්‍රතීතන සේවා සැපයීම හා ප්‍රවර්ධනය කිරීම<br>• ISO /IEC මගපෙන්වීම් 17065 පදනම්කර ගෙන භාණ්ඩ සහතිකකිරීමේ ආයතන සඳහා ප්‍රතීතන සේවා සැපයීම හා ප්‍රවර්ධනය කිරීම.<br>• ISO/IEC 17020 පදනම් කරගෙන පරීක්ෂණ ආයතන සදහා ප්‍රතීතන සේවා සැපයීම හා ප්‍රවර්ධනය කිරීම.<br>• ISO/IEC 17043 පදනම් කරගෙන නිපුනතා පරීක්ෂණ සදහා ප්‍රතීතන වැඩසටහන් ඇතිකිරීම හා ප්‍රවර්ධනය කිරීම.<br>• ISO /IEC 17024 පදනම්කරගෙන පුද්ගලයින් සහතික කිරීමේ ආයතන සඳහා ප්‍රතීතන සේවා සැපයීම හා ප්‍රවර්ධනය කිරීම.<br>• පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ආයතන විසින් නිපුනතා ඇති පුද්ගලයින් සඳහා ප්‍රතීතන සේවා සැපයීම හා ප්‍රවර්ධනය කිරීම. |

| | |
|---|---|
| | • ජාතික අවශ්‍යය තා මත වෙනත් ප්‍රතීතන වැඩපිළිවෙල ස්ථාපිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම.<br>• ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ප්‍රතීතන ක්‍රියාකාරකම් සඳහා ජාත්‍යන්තර පිළිගැනීම ලබාගැනීම හා අන්‍යෝන්‍ය අවබෝධතා ගිවිසුම් (MRA) හා බහුපාර්ශවීය ගිවිසුම් (MLA) අදාල ජාත්‍යන්තතර ආයතන සමඟ ඇතිකර ගැනීම. |
| **ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනත** | • අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB) 2005 අංක 32 දරණ අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනත යටතේ ස්ථාපිත කරන ලද ජාතික ප්‍රතීතන අධිකාරිය වේ. මෙම මණ්ඩලය තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක අතර 2005 අංක 32 දරණ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ වගන්තිවලට අනුව 13 දෙනෙකු ගෙන් යුත් පාලක සභාවකින් පාලනය වේ. |
| **ක්‍රියාකාරකම් හා උපායමාර්ග** | ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ජාතික ප්‍රතීතන අධිකාරිය ලෙස දේශීය හා විදේශීය වෙළඳපොළට භාණ්ඩ හා සේවා සැපයීමේදී ප්‍රතීතන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමට, ප්‍රතීතන සේවා ලබාදීමට හා අනුකූලතා තක්සේරු කිරීමට බැඳී ඇත.<br>මේ තුළින් රසායානාගාර, සහතික කිරීමේ ආයතන, පරීක්ෂණ ආයතන, කර්මාන්ත අංශයට, ව්‍යාපාරික ප්‍රජාවට, රජයට හා පාරිභෝගික ජනතාවට සිදුකරනු ලබන ප්‍රතීතනයන් ආවරණය වේ.<br>පනතට අනුකූලවන පරිදි ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය පහත සඳහන් උපායමාර්ග ක්‍රියාවට නැංවීම අවශ්‍ය වේ.<br>• ජාත්‍යන්තර හා ජාතික ප්‍රමිතියන්ට අනුව අනුකූලතා තක්සේරු ආයතන ප්‍රතීතනය කිරීම.<br>• ජාතික තත්ව ප්‍රතිපත්තියේ මගපෙන්වීම්වලට අනුකූලව ප්‍රතීතන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම.<br>• අනුකූලතා තක්සේරු සම්බන්ධ සහයෝගීතා හා සම්බන්ධීකරණ සංසදයක් ලෙස ක්‍රියාකිරීම.<br>• ප්‍රවර්ධනය හා තක්ෂණ දැනුම පැතිරවීම තුලින් ප්‍රතීතන ව්‍යවහාරයන් හා තක්සේරු පිලිවෙත්හි නිපුනතාවය ස්ථාපිත කිරීම.<br>• ප්‍රතීතනය සඳහා වන ජාතික පද්ධතීන් සඳහා සහායවීම හා |

| | |
|---|---|
| | සංවර්ධනය කිරීම.<br>• ජාත්‍යන්තරයේ ඇති සමානතලයේ ආයතන සමග අන්‍යෝන්‍ය පිළිගැනීම සම්බන්ධ ගිවිසුම් වලට ඇතුළත් කිරීම.<br>• ප්‍රතීතනය ප්‍රධානය කිරීම, දීර්ඝ කිරීම, අඩු කිරීම, අත්හිටුවීම, ඉවත්කරගැනීම සඳහා වන අනුකූලතා හා සුපරීක්ෂණ පරීක්ෂණ තක්සේරුක්‍රම සම්පාදනය හා කළමණාකරනය ක්‍රියාත්මක කිරීම. |

<table>
<tr><td>සභාපතිතුමාගේ පණිවුඩය</td><td></td></tr>
<tr><td colspan="2">ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ස්ථාපිත කිරීමේ මූලික අරමුණ වූයේ ජාතික තත්ව යටිතල ව්‍යුහය සවිමත්කිරීම සහ දේශීය/අන්තර්ජාතික වෙළඳ පොළ වෙත ඉදිරිපත්කරනු ලබන භාණ්ඩ/සේවා සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමයි. අනුකූලතා තක්සේරු ආයතන ප්‍රතීතනය මඟින් “දේශීය අන්තර්ජාතික වෙළඳම් ක්‍රියාකාරකම්වලදී සමාජීය සමතුලිතතාවය සහතික කරනු ලබයි.” මෙය මහින්දචින්තන ඉදිරි දැක්ම පාදකකොට තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් හඳුනාගත් එක් අරමුණකි.</td></tr>
<tr><td>ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය 2011 වසරේදී එහි පස් වසරක මෙහෙයුම්කාලය සම්පූර්ණ කරන ලදී. මෙම කාලය තුලදී අප විසින් සාර්ථක ප්‍රගතියක් අත්කරගෙන ඇත. ආරම්භයේදී ආයතනයට අවශ්‍ය මානව සම්පත බඳවාගෙන ඔවුන්ගේ හැකියාවන් දියුණු කිරීමට සහ විවිධ ප්‍රතීතන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ලේඛන සකසා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීමට සිදුවිය. මෙහිදී ඉතා වැදගත් සාධකයක් වූයේ බාහිර විශේෂඥයින් හඳුනාගෙන ඔවුන්ට ප්‍රතීතනය සහ තක්සේරුකිරීම් පිළිබඳ පුහුණුවක් ලබාදීමය. මේ වන විට 100කට අධික පුහුණුව ලැබූ විශේඥ තක්සේරුකරුවන්ගේ සංචිතයක් නිර්මාණය කොට ඇත.<br><br>ලඟාකරගත් විශේෂ කාර්‍යයන්<br><br>ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් 2011 වසර තුලදී මහජන සෞඛ්‍ය ආරක්ෂණය සහ පරිසර ආරක්ෂණය වෙත දැඩිව බලපාන රෙගුලාසි ක්‍රියාත්මක කරන නිළධාරීන් සමඟ සාකච්ඡා වට කිහිපයක් ආරම්භ කරන ලදී. සෞඛ්‍ය අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, රථවාහන දෙපාර්තමේන්තුව මේ සඳහා උදාහරණ කිහිපයකි. මෙම සාකච්ඡාවල</td><td><br><br><br><br><br><br><br><br><br><br><br>ප්‍රතීතනය ලොවපුරා ක්‍රියාත්මක වනුයේ ස්වේච්ඡා පදනමකිනි. එනමුදු මෙම ක්‍රියාවලිය මගින් අන්තර් ජාතික</td></tr>
</table>

| | |
|---|---|
| ප්‍රතිඵලයක් වශයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කොළඹ ජාතික රෝහල සහ රාගම, මහනුවර, කරාපිටිය හා රත්නපුර රජයේ රෝහල්වල වෛද්‍ය රසායනාගාර ISO 15189:2007 ප්‍රමිතියට අනුකූලව ක්‍රියාත්මක කොට ප්‍රතීතනය ලබාගැනීමට කටයුතු කිරීම සඳහා තෝරාගෙන ඇත.<br>මණ්ඩලය මගින් ප්‍රතීතන මූලධර්ම පිළිබඳව පුහුණුකරන ලද වෛද්‍යවරුන් ඔවුන්ගේ වෘතීය සංගම් හරහා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත මේ පිළිබඳව කරුනු ඉදිරිපත්කරන ලදී.<br>සෞඛ්‍යසේවා පනත නමින් නව පනත් කෙටුම්පත් සකස්කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පත්කරන ලද කමිටුවට ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ අධ්‍යක්ෂතුමන්ද ඇතුළත්කරන ලදී. මණ්ඩලය මඟින් පුද්ගලික වෛද්‍ය රසායනාගාර ප්‍රතීතනය සඳහා ඉදිරිපත්කරන ලද, අධියරෙන් අධියර ක්‍රියාත්මක කලයුතු ප්‍රතීතන වැඩපිළිවෙල මෙම කමිටුව ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගනු ලැබීය.<br><br>රථවාහන දුම් විමෝචනය පරීක්ෂාකරණ ආයතන සෝදිසි කිරීමේ ක්‍රියාවලිය ප්‍රතීතනය කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කිරීම 2011 වසර තුළදී ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මඟින් ආරම්භකරන ලදී. මෙය තවත් වැදගත් කාර්යයක් ලෙස සැලකිය හැක. මේ සඳහා අවශ්‍ය ලේඛන පිළියෙලකිරීමට තාක්ෂණික කමිටුවක් පත්කරන ලදී. මධ්‍යම පරිසර අධිකාරියේ සහ රථවාහන දෙපාර්තමේන්තුවේ නිළධාරීන් මෙම කමිටුවට සහභාගි කරගන්නා ලදී.<br><br>**ලෝක ප්‍රතීතන දිනය** - 2011-06-09<br><br>මෙවර ලෝක ප්‍රතීතන දින තේමාව වුයේ “රෙගුලාසි ක්‍රියාත්මක කරන්නට සහායවීම යන්නයි” මෙහිදී අවධාරණය වූයේ ප්‍රතීතන සංකල්පය රෙගුලාසි තුලට ඇතුලත් කිරීමේ ඇති වැදගත්කමයි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ලෝක ප්‍රතීතන දිනය සැමරීම සඳහා එක්දින වැඩමුළුවක් සහ ප්‍රතීතන සංධ්‍යාවක් සංවිධානය කරන ලදී. මෙම වැඩමුළුව ගරු තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය පවිත්‍රා වන්නි ආරච්චි මැතිණිය විසින් උත්සවාකාරයෙන් ආරම්භකරන ලදී.<br>මෙම උත්සවයේ ප්‍රධාන දේශනය පවත්වන ලද්දේ ඉන්දියාවේ | වෙළඳාම පහසුකිරීම සඳහාත් මහජන සෞඛ්‍ය සහ ආරක්ෂණය තහවුරු කිරීම සඳහාත් ඉතා වැදගත් බව බොහෝ රජයන් විසින් අවබෝධකොටගෙන, පවතින රෙගුලාසි තුලට මෙම සංකල්පය ඇතුලත් කිරීමට කටයුතු කොට ඇත. මෙමගින් ප්‍රතීතනය වක්‍රාකාරව අනිවාර්ය කරනු ලබයි. 2011 දී තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේදී ආශිර්වාද සහතිව මෙම ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය තීරණය කරන ලදී. |

සහතික කිරීමේ ආයතන ප්‍රතීතන මණ්ඩලයේ අධ්‍යක්ෂ බී.වෙන්තකරාමන් මහතා විසිනි. ප්‍රතීතන සහතික ප්‍රධානය ප්‍රතීතන සන්ධ්‍යාවේදී ගරු අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මැතිණියගේ සහභාගිත්වයෙන් සිදුවිය.

**ජාත්‍යන්තර පිළිගැනීම**

පරීක්ෂණාගාර සහ වෛද්‍ය රසායනාගාර ප්‍රතීතනය සඳහා ජාත්‍යන්තර පරීක්ෂණාගාර ප්‍රතීතන සහයෝගීතාවය (ILAC) සමඟ අත්සන් කරන ලද අන්‍යෝන්‍ය පිළිගැනීමේ සම්මුතිය (MRA) 2011 වසර තුළදීත් පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදුකෙරුනි. ක්‍රමාංකන පරීක්ෂණාගාර සඳහාත් මෙම සම්මුතිය අත්සන්කිරීමට අවශ්‍ය අයදුම්පත් ඉදිරිපත්කරන ලදුව 2011 නොවැම්බර් මසදී ජපානය, ඉන්දියාව සහ තායිපේ යන රටවලින් පැමිනි තක්සේරුකරුවන් තිදෙනෙක් විසින් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය තක්සේරු කරන ලදී. 2012 වර්ෂයේ මුල් භාගය තුල අපට මෙම සම්මුතිය අත්සන් කිරීමට හැකිවන බව මම තරයේ විශ්වාස කරමි. මේ අනුව පරීක්ෂණාගාර, වෛද්‍ය රසායනාගාර සහ ක්‍රමාංකන පරීක්ෂණාගාර සඳහා අප විසින් දෙනු ලබන ප්‍රතීතන සහතිකය ජාත්‍යන්තරව පිළිගනු ලැබේ. මේ නිසා විශාල විදේශ විනිමයක් වැයකොට විදේශ පරීක්ෂණාගාරතුළ සිදු කෙරෙන පරීක්ෂණ නැවත කිරීමක් අවශ්‍යය නොවනු ඇත.

**ස්තූතිය**

මෙම වසර තුලදී ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ කාර්‍යයන් සාර්ථකව ඉදිරියට ගෙනයාම සඳහා තම ප්‍රවීනත්වය තුළින් සහයෝගය දැක්වූ මහා මණ්ඩල සාමාජික මහත්ම මහත්මීන් වෙත මාගේ කෘතඥතාවය පිරිනැමීමට මෙය අවස්ථාවක් කරගැනීමට කැමැත්තෙමි. මණ්ඩලය තුළ පිහිටුවා ඇති කමිටු හරහා විවිධ ක්ෂේත්‍රයන්හි විශේෂඥයින් විසින් ඉටුකරන ලද කාර්ය භාරය ප්‍රශංසණීය වේ. සාර්ථක ප්‍රතීතන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යාවශ්‍යය වන විනිවිදභාවය මේ තුළින් තහවුරුවිය. විවිධ ආයතන ප්‍රතීතතනය සඳහා තක්සේරු කිරීමේදී විශේෂඥ තක්සේරුකරුවන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරන ලදී. ඔවුන්ගේ සහාභාගිත්වය අපි අගය කරමු. තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ගරු අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මැතිණිය සහ ලේකම් ධාරා විජේතිලක මැතිණිය ඇතුළු එහි නිළධාරි මහත්ම මහත්මියන්ගෙන් ලැබුනු සහයෝගයද අගය කල යුතුය.

| | |
|---|---|
| අවසාන වශයෙන් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ සේවක මහත්ම මහත්මීන්ගේ දයකත්වය මෙහිදී මාගේ විශේෂ ස්තූතියට ලක්කිරීමට කැමැත්තෙමි. වසර 5 ක් වැනි සුළු කාලයක් තුළදී ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයට මෙතරම් දිගුගමනක් යාමට හැකිවූයේ ඔබසැමගේ කැපවීම නිසාය. තවදුරටත් ආයතනයේ වැඩිදියුණුව සඳහා ඔබගේ දයකත්වය ලැබෙනබව මට විශ්වාසය.<br>**දිදුල් කෝදගොඩ**<br>**සභාපති,**<br><br>ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය එහි මෙහෙයුම් ක්‍රියාවලිය 2006 වර්ෂයේදී ආරම්භකල අතර 2007 වර්ෂය සම්පූර්ණ මෙහෙයුම් සිදුවූ වර්ෂය වේ. දැනටමත් දියත්කර ඇති ප්‍රතීතන ක්‍රම කරගෙන යන අතරතුරදීම 2011 වර්ෂයේදී රටේ ජාතික තත්ව යටිතල පහසුකම් ප්‍රවර්ධන නියාමන කටයුතු වෙනුවෙන් ප්‍රතීතන කටයුතු ප්‍රවර්ධනය කිරීම ප්‍රතීතනය සලසන ආයතනයක මූලිකම වගකීමකි. මේ සම්බන්ධයෙන් 2011 වර්ෂයේදී ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ නිපුනතාවය වර්ධනය වී ඇත.<br><br>දේශීය හා විදේශීය වෙළඳපොළ සඳහා භාණ්ඩ හා සේවා සැපයීමේදී ප්‍රතීතනය වැදගත් සහායක් ලබාදෙයි. රටකට අංගසම්පූර්ණ ප්‍රතීතනයන් ලබාදීම සම්බන්ධයෙන් නියාමන අධිකාරීන් විසින් සපයනු ලබන තාක්ෂණ විනිශ්චයන් වැඩිකළයුතුව ඇත.<br><br>දේශීය හා විදේශීය වෙළඳපොළට සපයන ගුණාත්මක භාණ්ඩ හා සේවාවල ඉල්ලුම වැඩිවීමත් සමඟ සෞඛ්‍ය හා ආරක්ෂණය සඳහා වන තාක්ෂණික රෙගුලාසි, ප්‍රමිතීන් හා වෙනත් රෙගුලාසි හා මිනුම්වල අවශ්‍යයතාවය ඇති විය. සෞඛ්‍යමය ආරක්ෂිතභාවය, පාරිසරික ආරක්ෂිතතාවය, වංචා වැලැක්වීම හා සාධාරණ වෙළඳපොළ සඳහා නීතිමය රාමුවක් තුල භාණ්ඩ හා සේවාවලට ආවරණ අනුමැතියක් ලබාදීම තුළින් රජයේ අධිකාරීන්ට පහසුවෙන් නිතීරීති සම්පාදනය කිරීමේ හැකියාව ඇත.<br><br>ප්‍රතීතනය සාමාන්‍යයෙන් ස්වේච්ඡා පදනමක් ස්වේච්ඡා සේවාවක් ලෙස පිරිනමනු ඇත. සේවා අංශය ඇතුලු කර්මාන්ත අංශයේ අනුකූලතා තක්සේරු ස්ථාපිත කිරීම නිෂ්පාදනයක්, ක්‍රියාවලියක් හෝ පද්ධතියක් සඳහා නිශ්චිත ප්‍රමිතියක් ලගාකර ගැනීමේ අරමුණින් | **අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක විග්‍රහය**<br>නිශ්චිත රාමුවක් තුල සෞඛ්‍ය, ආරක්ෂාව, පාරිසරික සුරක්ෂිතතාව, වංචා වැලැක්වීම හා සදරණ වෙළඳපොළ ආරක්ෂාවන අයුරින් භාණ්ඩ හා සේවා වල අනුමැතිය සම්බන්ධයෙන් රජයට පහසුවෙන් නීති රෙගුලාසි පැනවිය හැක. |

| | |
|---|---|
| සිදුකෙරේ. එමගින් වෙළඳපොළට අවතීර්ණය වීම භාණ්ඩ හා සේවා සංසන්දනය කිරීමට සමාන තේමාවන් යටතේ තරඟ කිරීමට දේශීයව හා ජාත්‍යන්තරව අවකාශ ලැබේ. භාණ්ඩ හා සේවා තාක්ෂණික රෙගුලාසි හෝ ප්‍රමිතීන්ට අනුකූලදැයි පිරික්සීමට ප්‍රවීන හා විශ්වාසදයි පිළිවෙත් අදල අනුකූලතා තක්සේරු සම්බන්ධයෙන් පරීක්ෂණ හා සහතිකකිරීම් සඳහා වන අනුකූලතා පදනමින් සිදුකිරීම, ඒ සඳහා<br><br>ප්‍රමිතියක් දරණ ආයතන මඟින් සිදුකරනු ලබයි. ඒ සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන අනුකූලතා තක්සේරු ආයතනවලට ඇති නිපුනතාවය හා එම කටයුතුවල විනිවිදභාවය හා විශ්වාසවන්තභාවය සම්බන්ධව ගැනුම්කරුවන්ට නීති සම්පාදනය හා පොදු මහජනතාව දැනුවත්විය යුතුය. දේශීය හා විදේශීය වශයෙන් පිලිගත් ආකාරයට අනුකූලතා තක්සේරු සිදුකිරීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් මූලධර්ම හා ප්‍රමිතීන් භාවිතය මගින් ප්‍රතීතනය සම්බන්ධ හොද පිළිගැනීමක් ලබාදේ. | |
| ජාත්‍යන්තර ප්‍රජාවට, ප්‍රතිපත්තිවලට අනුව පිළිගතහැකි ප්‍රතීතන නිර්ණායක හා පිළිවෙත් පවත්වාගෙනයාම ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයට ඇති ප්‍රධාන අභියෝගයකි. මේ යටතේ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ක්‍රියාවලියේ එක් ප්‍රධාන කටයුත්තක් වන්නේ ප්‍රතීතන ක්‍රම හඳුනාගැනීම, ඒවා වැඩි දියුණු කිරීම, පවත්වාගෙන යාම, පද්ධති හා අත්පොත් සැකසීම හා ඒවා වැඩි දියුණු කිරීම වේ. මේ සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රතීතන අවශ්‍යතා හදුනාගැනීම, නිරන්තර අධීක්ෂණය හා ජාත්‍යන්තර උපදෙස්මාලා යාවත් කිරීම අත්‍යවශ්‍යවේ.<br><br>තවත් ප්‍රධාන කාර්ය්‍යයක් වන්නේ කාර්ය මණ්ඩලය හා තක්සේරු කරුවන්ගේ ප්‍රතීතනය පිරිනැමීම සඳහා අවශ්‍ය කරන දැනුම වර්ධනය කිරීමයි. පුහුණු පුද්ගලයින් හා විශේෂඥයින් විවිධ අංශ හෝ අනුඅංශ සඳහා තෝරාගැනීම හා තවදුරටත් ඔවුන් පුහුණු කිරීම තවත් අභියෝගයකි. එසේවුවත් භෞතික හා මූල්‍ය සීමාවන් අභිබවමින් 2011 වර්ෂයේදී ප්‍රවීණ හා විශ්වාසවන්ත සම්පත් පදනමක් කළමනාකරණය කරගැනීමට ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයට හැකි වී ඇත.<br><br>තවද ප්‍රතීතන ආයතනයකට නොසලකා හැරීමට නොහැකි තවත් ප්‍රධාන කාර්ය්‍යයක් වන්නේ , ප්‍රතීතනය පිරිනැමීම සඳහා අවශ්‍ය කරන | **රටේ පවතින ජාතික පරීක්ෂණ රසායානාගාර නිපුන ලෙස පවත්වාගෙන යාම සඳහා මිනුම්කරණ සැකසීම හා ලබාදීම සඳහා මහත් පරිශ්‍රමයක් ගන්නා ලදී.** |

| | |
|---|---|
| දැනුම වර්ධනය කිරීමයි. පුහුණු පුද්ගලියන් හා විශේෂඥයින් විවිධ අංශ සඳහා තෝරා ගැනීම හා තවදුරටත් ඔවුන් පුහුණු කිරීම අවශ්‍ය වේ. | |
| ප්‍රතීතනයේ අවශ්‍යතා පදනම් කරගෙන විවිධ වර්ගයේ වෙළඳුම් හා සේවා වෙනුවෙන් පහසුකම් සැපයීම සදහා අයදුම්පත් තක්සේරු කිරීම හා එමගින් කරුණු අනාවරණය කර ගැනීම ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ අරමුණ හා මෙහෙවර වේ. ඉහත අධීක්ෂණය අනුව පරීක්ෂණාගාර, ක්‍රමාංකන රසායානාගාර, වෛද්‍ය රසායනාගාර, සහතික කිරීමේ ආයතන හා පරීක්ෂණ ආයතන ආවරණය වන පරිදි අදාළ ජාත්‍යන්තර ප්‍රමිති පිළිගනු ලැබේ. | |
| පරීක්ෂණ හා ක්‍රමාංක රසායනාගාර ප්‍රතීතන ක්‍රම තවදුරටත් ප්‍රධාන කටයුත්තක් ලෙස ඉදිරියට ගෙනයමින් විනිවිද දැකිය හැකි රසායන නිෂ්පාදන, ආහාර හා කෘෂි නිපැයුම් , රෙදි නිෂ්පාදනය , පස හා පොහොර යනාදී වශයෙන් විවිධ විෂය පථයන්ට ව්‍යාප්ත කර ඇත. රටේ පවතින පර්යේෂණාගාර නිසි අයුරින් ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය මිනුම් හා විද්‍යාත්මක සහය ලබා දීම සඳහා 2011 වසරේදී දැඩි උත්සහයක් ගන්නා ලදී. මේ සම්බන්ධයෙන් රටේ ජාතික මිනුම් විද්‍යාත්මක යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ජාතික මිනුම් විද්‍යා ආයතන වන මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව ඉතා අගනා සහයක් දක්වනු ලබයි. | **වෛද්‍ය රසායනාගාර තක්සේරු කිරීම සම්බන්ධ නිපුනතාවය වර්ධනය කිරීම. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය බාරගතයුතු තවත් ප්‍රධාන ක්‍රියාවලියකි.** |
| සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රයේ වෛද්‍ය රසායනාගාර සේවාවේ විශ්වාසය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වෛද්‍ය රසායනාගාර තක්සේරු කිරීමේදී සෞඛ්‍ය අමාත්‍යංශය සහ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව සමඟ ඉතා සහයෝගයෙන් වැඩි කටයුතු කරනු ලබයි. ඉදිරි පියවරක් ලෙස සෞඛ්‍ය අමාත්‍යංශය දැනට මූලික වශයෙන් හදුනාගත් රෝහල් 05 ක රසායනාගාර වැඩි දියුණු කිරීම ආරම්භ කර ඇත. සෞඛය අමාත්‍යංශය ජාත්‍යන්තර ප්‍රමිත ISO 15189 අවශ්‍යතා අනුව ඉහත රසායනාගාර සදහා ක්‍රමවේදයන් වැඩි දියුණු කිරීමට හා කාර්යමණ්ඩල නිපුනතාවයන් වර්ධනය කිරීම සිදු කරමින් පවතී. ඊට අමතරව රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වෛද්‍ය හා චිකිත්සාගාර රසායනාගාර ලියාපදිංචිය අදියර තුනකින් ක්‍රියාත්මක | |

| | |
|---|---|
| කිරීමට යෝජනා කර ඇත. ඒතුළින් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ තක්සේරුව පිළිබඳ අපක්ෂපාතී බව හා විශ්වාස වන්ත බව තහවුරු වේ. වෛද්‍ය රසායනාගාර වල නිපුණතාවය වැඩි දියුණු කිරීම ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය කළ යුතුව ඇති තවත් ප්‍රධාන කටයුත්තකි. | |
| ආයාත හා නිර්යාත සැලකිල්ලට ගත් කළ භාණ්ඩ නිදහස් කර ගැනිමේදී නිෂ්පාදන හා පද්ධති වල ගුණාත්මක භාවය සම්බන්ධව තුන්වන පාර්ශවයකට පිලිගත හැකි වාර්තා අවශ්‍ය වේ. ගැණුම් කරුවන් තවමත් විදේශිය ප්‍රතීතන ආයතන කෙරෙහි වැඩි කැමැත්තක් දැක්වීම හේතුවෙන් තවමත් ශ්‍රී ලංකාවේදි ප්‍රතීතනය ලබා දීම සම්බන්ධයෙන් විදේශිය ප්‍රතීතන ආයතන ප්‍රධාන තැනක් ගෙන කටයුතු කරනු ලබයි. මෙම තත්වය අවම කිරීම අරමුණු කොට ගෙන ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය 2011 වර්ෂයේදී ජාත්‍යන්තර ප්‍රතීතන ආයතන සමඟ බහුපාර්ශවීය පිළිගැනීමේ වැඩ සටහන් වලට යොමු වන ලදී. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ උපාය මාර්ගය වන්නේ විදේශිය ප්‍රතීතන ආයතන මට්ටමට අප ආයතනය ගෙන ඒමත් සහ ප්‍රතීතන ක්ෂේත්‍රයේ තරඟකාරි ලෙස කටයුතු කිරීමත්ය.<br><br>එසේම විදේශ රටවල ප්‍රතීතන ආයතන වලට අනුබද්ධිත විදේශිය ප්‍රතිතනයන්ට පහසුකම් සලසන ප්‍රතීතන සේවාවල තත්වය පමණක් නොව පිරිවැයද සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ සේවා ලබා ගැනිමේ නැඹුරුවක් ඉදිරියේදී බලාපොරොත්තුවේ.<br><br>නීතිරීති සම්පාදනය කරන ආයතන වල බලපෑම අඩු වීම හේතුවෙන් කර්මාන්ත හා වෙළඳ ක්ෂේත්‍රයේ විශාල පරාසයක් ආවරණය වන සෝදිසි කිරීමේ ආයතන වලින් කරන අයදුම් කිරීම් බලාපොරොත්තු මට්ටමට වර්ධනය වී නැත. මෙම හේතුව නිසා 2011 වර්ෂයේදී සහතික ලත් ආයතන සංඛ්‍යාව වර්ධනය කිරීම පදනම් කරගෙන එලදයී තාක්ෂණ රෙගුලාසි හදුනාගැනිම හා ඒවා ක්‍රියාවේ යෙදවීම තුළින් ප්‍රතීතනය ප්‍රවර්ධනයට කටයුතු කල යුතුව ඇත. මෙය සැලකිල්ලට ගෙන ආහාර සුරක්ෂිතභාවයට හා වාහන දුම් පරීක්ෂාව සම්බන්ධ ප්‍රතීතන සැලසුම් සැකසීම සඳහා ඊට අදාළ නීතිරීති | **2011 වර්ෂයේදී ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය තවත් අඩියක් පෙරට තබමින් ජාත්‍යන්තර පිළිැනීම සඳහා බහුලාර්ශවීය පිළිගැනීම සඳහා එකගවීම සහ වෙළඳපොළෙහි ප්‍රතීතන ආයතන අතර සමාන හා තරඟකාරී තත්වයකට ලගාවීම සිදුව ඇත.**<br><br>**නීතිරීති පනවන අධිකාරීවලින් දක්වන අඩුප්‍රතිචාරය හේතුවෙන් විශාල වශයෙන් අයදුම්පත් ලැබියයුතු පරාසයක පිහිටි කර්මාන්ත හා වෙළඳ ප්‍රජාවගේ පවතින පරීක්ෂණ ආයතනවලින් ප්‍රතීතනය සඳහා අයදුම්පත් ලැබීම බලාපො** |

| | |
|---|---|
| පනවන අධිකාරි සමඟ කිට්ටු සම්බන්ධතාවයෙන් කටයුතු කරන ලදී. ආහාර සුපරීක්ෂාව සහ වාහන දුම් පරීක්ෂාව සඳහා වන ප්‍රතීතන සැලසුම් වැඩි දියුණු කරන තත්වයේ පවතී. මෙම ප්‍රතීතන සැලසුම් සඳහා අවශය කරන නිශ්චිත නිර්නායකයන් ඊට අදාළ අංශ වල වෘත්තිකයින්ගේ හා විශේෂඥයින්ගේ මැදිහත් වීම මත වැඩි දියුණු වෙමින් පවතී.<br><br>අමාත්‍යංශයේ, විද්‍යා හා තාක්ෂණ හා නව්‍යකරණ උපාය මාර්ගවලට අනුකූලව රටේ පවතින රසායනාගාර ශ්‍රේණිගත කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා සුදනම් කරන ලද වෘත්තියක් ලෙස යහපත් හොද රසායනාගාර ක්‍රියාවලියක් සඳහා ප්‍රතීතන සැලසුම් ආරම්භ කර ඇත. යහපත් රසායනාගාර ක්‍රියාවලියක් සඳහා වන ප්‍රතීතන නිර්නායක ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මගින් මේ වන විට වැඩි දියුණු කරමින් පවතී.<br><br>ප්‍රතීතනය නිපුණතාවය නිරූපණය කරන අදහසින් කරන නිශ්චිත කටයුත්තක් නිසා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය, ගුණාත්මක බාවය හා ප්‍රතීතනය සම්බන්ධ පුහුණු වැඩ සටහන් හා වැඩ මුළු ගණනාවක්ම පවත්වන ලදී. මෙම වැඩසටහන් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ තක්සේරු කරුවන් රසායනාගාර සේවාමණ්ඩල හා ඊට සම්බන්ධ තෝරාගත් කොටස් අරමුණු කොට සිදු කරන ලදී. ප්‍රතීතනය තක්සේරු කරගෙන යෑම සඳහා නිපුණතා සංවර්ධනය මූලිකවම අත්‍යවශ්‍ය අංගයකි. මීට අමතරව තෝරාගත් නිශ්චිත කොටස් සඳහා දැනුවත් කිරීම් හා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.<br><br>2005 අංක 32 දරණ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ ප්‍රතිපාදන යටතේ ගරු තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යවරයා වශයෙන් පත්කරනු ලබන 13 දෙනෙකුගෙන් යුත් පාලක මණ්ඩලයට එහි ක්‍රියාකාරී බලතල පැවරී ඇත. සෑම මාස දෙකකට වරක් පාලක සාභාව රැස්වීම සිදු විය. | **රොත්තු මට්ටමින් සිදුනොවේ.** |

| | |
|---|---|
| **පාලක සභාවේ සංයුතිය පහත පරිදි වේ**<br>දිදුල් කෝදගොඩ මහතා - සභාපති<br>මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු මිය. - සාමාජික (සභාපතිනිය, ජාතික විද්‍යා පදනම)<br>ආචාර්ය නිර්මලී ද සිල්වා මිය - සාමාජික, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පේෂකර්ම දෙපාර්තමේන්තුව මොරටුව විශ්ව විද්‍යාලය<br>සුසන්ත ප්‍රනාන්දු මහතා - සාමාජික (ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය නියෝජන කරමින්)<br>ආචාර්ය ඒ.එම්.මුබාරක් මහතා - සාමාජික (තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යංශය නියෝජනය කරමින් )<br>ඒ.පී.ජී.කිත්සිරි මහතා - සාමාජික (වෙළඳ අමාත්‍යංශය නියෝජනය කරමින්)<br>අසිත කේ සෙනවිරත්න මහතා - සාමාජික(කර්මාන්ත සංවර්ධන අමාත්‍යංශයනියෝජනය කරමින්)<br>කේ.පී.කුමාර මහතා - සාමාජික (කිරුම් මිනුම් ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින්)<br>මහාචාර්ය එම්.අයි.තාබ්බෲ මිය - සාමාජික (විද්‍යා ඇකඩමිය නියෝජනය කිරීමින් )<br>එම්.ජී.ජී.ජේ.ධර්මසේන මහතා - සාමාජික (කෘෂිකාර්මික අමාත්‍යාංශය නියෝජනය කරමින්)<br>එන්.ජී.පණ්ඩිතරත්න මහතා - සාමාජික (සෞඛ්‍ය අමාත්‍යංශය නියෝජනය කරමින්)<br>හිරන්සා කලුතන්ත්‍රි මිය - සාමාජික ( මහාභාණ්ඩාගාරය නියෝජනය කරමින්)<br>තිස්ස ජයවීර මහතා - සාමාජික ( ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත වානිජ මණ්ඩලය නියෝජනය කරමින්)<br>ටී.වික්‍රමසිංහ මහතා - ලේකම් අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය | **පාලක සභාව** |

<table>
<tr><th colspan="2">කළමණාකරණ කමිටු හා ආයතනයේ කාර්ය මණ්ඩලය</th></tr>
<tr><td>ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ කළමණාකරණ කටයුතු අධ්‍යක්ෂ ප්‍රධාන විධායක වෙත පැවරී ඇත. සංවිධාන ව්‍යුහයේ දක්වා ඇති අයුරින් මණ්ඩලයේ සියලු තාක්ෂණ හා මූල්‍ය හා පරිපාලන කටයුතු සඳහා කාර්ය මණ්ඩලයේ සහය අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක වෙත ලැබුනු ඇත.</td><td>කළමණාකරණය</td></tr>
<tr><td>පාලක සභාවට හා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ කාර්යසාධනයට හා ක්‍රියාකාරකම් සඳහා මඟපෙන්වීම හා උපදේශනය ලබා දීම වෙනුවෙන් අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමෙන් යුත් පුද්ගලයින්ගෙන් සමන්විත කමිටු පාලක සභාව විසින් පත් කොට ඇත.</td><td>කමිටු</td></tr>
<tr><td>ප්‍රතිපත්ති උපදේශක කමිටුව</td><td>විවිධ ක්ෂේත්‍රයන්හි ක්‍රියාත්මක ප්‍රතීතන සැලසුම් සම්බන්ධයෙන් වැඩි දියුණු කල යුතු ප්‍රතිපත්ති මය කරුණු සම්බන්ධයෙන් ප්‍රතිපත්ති උපදේශක කමිටුව පාලක සභාවට අවශ්‍ය උපදෙස් ලබාදීම සිදු කරනු ලබයි.</td></tr>
<tr><td>ප්‍රතීතන කමිටු</td><td>අදාළ ප්‍රතීතන වැඩපිළිවෙල සම්බන්ධ කළමනාකරණය හා ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් අනුකූලතා තක්සේරු අනුමත කිරීමේ තීරණ සම්බන්ධ උපදෙස් ලබා දීම පහත සඳහන් ප්‍රතීතන මණ්ඩල කමිටු වලට පැවරී ඇත.<br>01. පරීක්ෂණ හා ක්‍රමාංකණ රසයානාගර ප්‍රතීතන කමිටුව<br>02. වෛද්‍ය චිකිත්සාගාර රසායනාගාර ප්‍රතීතන කමිටුව<br>03. සහතික කිරීමේ ආයතන ප්‍රතීතන කමිටුව</td></tr>
<tr><td>තාක්ෂණ උපදේශක කමිටු</td><td>පහත සඳහන් තාක්ෂණ උපදේශක කමිටු ඒ ඒ නිශ්චිත කාර්‍යයන් තුළින් පැන නැගෙන කරුණු සම්බන්ධයෙන් උපදේශක සේවා ලබා දීමට බැඳී ඇත.<br>01. රසායනික පරීක්ෂණ සම්බන්ධ තාක්ෂණ උපදේශක කමිටුව<br>02. ජීව විද්‍යාත්මක පරීක්ෂණ සම්බන්ධ තාක්ෂණ උපදේශක කමිටුව<br>03. යාන්ත්‍රික පරීක්ෂණ හා ක්‍රමාංකණය පිළිබඳ තාක්ෂණ උපදේශක කමිටුව<br>04. වෛද්‍ය / රසායන පරීක්ෂණ පිළිබඳ තාක්ෂණ උපදේශක කමිටුව<br>05. කාබනික සහතික කිරීමේ සම්බන්ධ උපදේශක කමිටුව<br>06. යහපත් රසායනාගාර භාවිතය සම්බන්ධ තාක්ෂණ උපදේශක කමිටුව</td></tr>
</table>

| | |
|---|---|
| | 07. ආහාර සුරක්ෂිතාවය සම්බන්ධ තාක්ෂණ උපදේශක කමිටුව<br>08. වාහන දුම් විමෝචන පරීක්ෂාව සම්බන්ධ තාක්ෂණ උපදේශක කමිටුව<br>09. තත්ව කළමණාකරණ පද්ධති සහතික කිරීම සම්බන්ධ උපදේශක කමිටුව<br>10. පාරිසරික කළමණාකරණ පද්ධතී සහතික කිරීම සම්බන්ධව තාක්ෂණ උපදේශක කමිටුව. |
| | ප්‍රතිපත්ති උපදේශක කමිටු හා තාක්ෂණ උපදේශක කමිටු ව්‍යුහය ඇමුණුම් 1 හි දැක්වේ. |

| | |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මානව සම්පත කුඩා වූ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයකින් හා විද්වත් ප්‍රජාවගෙන් හා විවිධ වෘත්තීය ආයතන වලින් ලබා ගත් විශාල බාහිර තක්සෙරු කරුවන්ගේ සංචිතයකින් සමන්විතව නිර්මාණය වී ඇත.<br><br>ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය අනුකූලතා තක්සේරු ආයතන වල නිපුණතාවය සම්බන්ධව විශ්වාසය ඇතිව කටයුතු කරන නිසා ප්‍රතීතන මණ්ඩලය නිලධාරීන්ට සමාන නිපුණතාවය තිබිය යුතු බව විශේෂයෙන් සඳහන් කළ යුතු නැත. ආරම්භයේ සිට නොකඩවා සේවයේ නිරත වන සේවකයින්ගේ දයකත්වය මණ්ඩලයේ ක්‍රියාකරකම් වෙනුවෙන් මහත් පිටුවහලක් වී ඇත. එබැවින් වෙනත් පිළිගත් ප්‍රතීතන ආයතන වලට සමගාමීව ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ප්‍රතීතන පද්ධති පවත්වාගෙන යාමට හැකිවීමේ ප්‍රශංසාව නිළධාරීන්ට හිමි විය යුතුය. | **මානව සම්පත** |

| 2011.12.31 දිනට මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පහත පරිදි වේ. | | | |
|---|---|---|---|
| **තනතුර** | **අනුමත** | **දැනට සිටින** | **පුරප්පාඩු** |
| අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක | 01 | 01 | - |
| අතිරේක අධ්‍යක්ෂ | 01 | - | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (ප්‍රතීතන) | 07 | 05 | 02 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ මුදල් හා පාලන | 01 | 01 | - |
| කළමනාකරණ / ගිණුම් සහායක | 03 | 01 | 02 |
| රියදුරු | 01 | 01 | - |
| කාර්යාල කාර්ය සහායක | 01 | 01 | - |

| | |
|---|---|
| **තක්සේරුකරුවන් මඩුල්ල** | විවිධ කේෂත්‍රයන්හි කෙරන ප්‍රතීතන පද්ධති ස්ථාපිත කිරීමේදී අදාළ කේෂත්‍රයන්හි පුහුණුව ලත් විශේෂඥතාවයෙන් යුත් තක්සේරු කරුවන්ගේ සේවාව ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ප්‍රයෝජනයට ගනු ලබයි. මේ සම්බන්ධයෙන් 130 දෙනෙකුගෙන් යුත් පුහුණු බාහිර තක්සේරු කරුවන්ගේ සංචිතයක් පහත සඳහන් තක්සෙරු මණ්ඩලයේ සේවකයින් සමග කරගෙන යාම සඳහා ස්ථාපිත කර ඇත.<br>පුහුණුව ලබන තක්සේරුකරුවෙකුට අනුකූලතා තක්සේරුවක් භාර දීමට මත්තෙන් එම ක්‍රියාවලියේ මෙන්ම කේෂත්‍රයේද මනා පුහුණුවක් ලබා නිපුනත්වයට පත් විය යුතුය.<br>ප්‍රතීතන සේවාවේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන විශේෂඥ දැනුමෙන් යුත් 20 දෙනකුගෙන් යුත් තක්සේරු කරුවන් පුහුණු කිරීමේ වැඩ සටහන් දෙකක් පවත්වන ලද අතර එමගින් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ තක්සේරු සංචිතය වර්ධනය කරන ලදී. |

| ප්‍රතීතන ක්ෂේත්‍රයන් | මෙහෙයුම් තක්සේරුකරුවන් | තාක්ෂණ තක්සේරුකරුවන් | පුහුණු තක්සේරු කරුවන් |
|---|---|---|---|
| පරීක්ෂණ | - | 21 | 16 |
| ක්‍රමාංකන | 02 | 05 | 04 |
| වෛද්‍ය පරීක්ෂණ | - | 12 | 26 |

| | | | |
|---|---|---|---|
| සහතික කිරීම | 03 | 04 | 29 |
| පිරික්සුම් | - | - | 08 |
| මණ්ඩලයේ සේවකයන් | 03 | 01 | 01 |
| එකතුව | 08 | 43 | 84 |

| | **ක්‍රියාකාරකම්** |
|---|---|
| ISO /IEC 17011 : 2004 සහ ජාත්‍යන්තර ප්‍රතිපත්ති, පිළිවෙත් හා මාර්ගෝපදේශ පදනම් කරගෙන ප්‍රතීතන සැලසුම් ස්ථාපිත කිරීම ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වේ.<br>ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතීතන සැලසුම් පහත පරිදි වේ.<br>-ISO /IEC 17025 පදනම් කරගත් පරීක්ෂණ හා ක්‍රමාංකනය සඳහා වු ප්‍රතීතන සැලැස්ම<br>-ISO / 15189 පදනම් කරගත් වෛද්‍ය හා රසායනික රසයානාගාර සඳහා වු ප්‍රතීතන සැලස්ම<br>-ISO /IEC : 17021 පදනම් කරගත් සහ සහතික කරන ආයතන වල පද්ධති සඳහා වු ප්‍රතීතන සැලැස්ම<br>-ISO /IEC මඟපෙන්වීම 65 පදනම් කරගත් සහතික කළ ආයතන වල නිෂ්පාදන සඳහා වු ප්‍රතීතන සැලැස්ම<br>-ISO /IEC 17024 පදනම් කරගත් සහතික කරන ආයතන වල පුද්ගලයින් සඳහා වු ප්‍රතීතන සැලැස්ම<br>-ISO /IEC : 17020 පදනම් කරගත් පිරික්සුම් ආයතන සඳහා වු ප්‍රතීතන සැලැස්ම.<br><br>ඉහත සඳහන් ප්‍රතීතන සැලැසුම් කළමනාකරණය කිරීමටත් නඩත්තු කොට පද්ධති වැඩි දියුණු කිරීමත් 2011 වර්ෂයේදී ද සිදු විය. එසේම 2011 නොවැම්බර් මාසයේ APLAC ආයතනය සිදු කරන ලද නැවත ඇගයීමේ ක්‍රියාවලිය අනුව පරීක්ෂණ සඳහා වන ISO 15189 ඇතුළුව APLAC / ILAC/MRA තත්වයන් සාර්ථක ලෙස පවත්වා ගැනීමට හැකි වී ඇත.<br><br>පැසිපික් ප්‍රතීතන සංස්ථාවේ ( PAC) හා ජාත්‍යන්තර ප්‍රතීතන සංසදය ( IAF ) හි සමතත්වයේ මඟ පෙන්වීම් වලට අනුව සහතික කිරීමේ ආයතනය සඳහා ප්‍රතීතන සැලසුම් වැඩි දියුණු කර ඇත. | **ISO /IEC 17011 : අනුව ශ්‍රී ලංකා ප්‍රතීතන ක්‍රියාවලිය මෙහෙයුම හා කළමණාකරණය** |

| | |
|---|---|
| ISO /IEC : 17025 : 2005 පදනම් කරගෙන කරනු ලබන පරීක්ෂණ රසායනාගාර ප්‍රතීතන, ශ්‍රි ලංකා ප්‍රතීතන මණ්ඩලය සපයන ප්‍රතීතන සේවාවලින් විශාල කොටසක් ආවරණය කරනු ලබයි. අනවශ්‍ය තාක්ෂණ බාදක ඉවත්කර දේශීය හා විදේශීය වෙළඳාම සඳහා විශ්වාසවන්ත පරීක්ෂණ සහතිකවල අවශ්‍යයතාවය මතුවීමත් සමඟ, 2011 වසරේදී පරීක්ෂණ රසායනාගාර ප්‍රතීතනයන් වැඩිවීමක් පෙන්නුම්කර ඇත.<br><br>වර්ෂය තුල, පරීක්ෂණාගාර ප්‍රතීතන 7කට ප්‍රතීතනය පිළිගැනීමත් සමඟ මුලු ප්‍රතීතන ලබාගත් සංඛ්‍යාව 37 කි. ප්‍රතීතනය සඳහා අලුත් අයදුම්පත් 7 ක් ද ලැබී ඇත. මෙම ප්‍රතීතන වැඩසටහන් යටතේ නිරීක්ෂණ 22 ක්, මූලික තක්සේරු 7 ක්, නැවත තක්සේරුකිරීම් 2 ක්, පූර්ව පරීක්ෂණ 3 ක් හා එක පසු විපරම් තක්සේරුවක් සැලසුම්කල පදනමින් වර්ෂය තුල සිදුකරනලදී. ප්‍රතීතනය පිරිනමන වපසරියෙහි රසායනික පරීක්ෂණ, ජෛවීය පරීක්ෂණ හා භෞතික / වෛද්‍ය පරීක්ෂණ ක්ෂේත්‍රයේ පරිනමන පරීක්ෂණ වනුයේ , ආහාර, කෘෂිකාර්මික, නිෂ්පාදන, පස, සිමෙන්ති,කොන්ක්‍රීට්, රෙදිපිලි, පොහොර හා සත්ව රෝග යනාදිය වේ. | **පරීක්ෂණ රසායනාගාර ප්‍රතීතනය** |
| ISO /IEC : 17025 : 2005 ට අනුව ප්‍රතීතනය ලද ක්‍රමාංකන රසායනාගාර සංඛ්‍යාව අඩු වුවද විශ්වාසවන්ත මිනුම් හා ප්‍රමිති ව්‍යවස්ථාපිත කිරීම රටකට අවශ්‍යය වන්නේ, පරීක්ෂණ රසායනාගාරවලින් විශ්වාසවන්ත ප්‍රතිඵල ලබාදිය යුතු බැවිනි.<br><br>2011 වර්ෂයේදී රටේ පවතින බොහොමයක් ක්‍රමාංකන රසායනාගාර ලියාපදිංචිකිරීම සඳහා සර්වවාදී එළඹුමකට පිවිසෙන ලදී.<br><br>එක් ක්‍රමාංකන රසායනාගාරයක් ප්‍රතීතන කරන ලද රසායනාගාරවලට එක්වීමත් සමඟ මුළු ප්‍රතීතන කරන ලද ක්‍රමාංකනාගාර සංඛ්‍යාව 3 ක් දක්වා වැඩිවිය. මේ සඳහා කිරුම් මිනුම් ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුවෙන් ලද අයදුම්පත සමඟ අලුතින් අයදුම්පත් 2ක් ලැබුණි. සුපරීක්ෂණ පරීක්ෂණ දෙකක්, | **ක්‍රමාංකන රසායනාගාරවල ප්‍රතීතනය** |

| | | |
|---|---|---|
| එක් මූලික තක්සේරුවක්, පූර්ව තක්සේරු 2 ක් වර්ෂය තුලදී සිදුකරන ලදී. ක්‍රමාංකනය ආවරණයවන වපසරියට යටත්වූයේ ස්කන්ධය, උෂ්ණත්වය, දිග, වේලාව, වාර ගනන, පරිමාව හා පීඩනය වේ. | | |
| **වෛද්‍ය චිකිත්සක රසායනාගාරවල ප්‍රතීතනය** | වෛද්‍ය/චිකිත්සක රසායනාගාර ප්‍රතීතන වැඩපිළිවෙල ස්ථාපිත කරන ලද්දේ ISO 15189 සියලු ක්‍රියාවලින් හා තක්සේරු පිලිවෙත් සහ ජාත්‍යතයන්තරව පිළිගත් පිළිවෙත් හා ප්‍රමිත පදනම්කරගෙනය. 2011 වර්ෂයේදී සෞඛ්‍ය අමාත්‍යාංශය සැලසුම් වැඩිදියුණු කිරීමට ඇල්මක් දැක්වීම, සෞඛ්‍ය අංශයේ විශ්වාසවන්ත සේවාවක් සැපයීමට විවෘත වූ නව මාවතක් ලෙස සැලකිය හැකිය. විශේෂඥ කණ්ඩායම් 4 ක් වන ජෛව රසායන විද්‍යා, Biochemistry, රක්තවේද, Heamatology, ක්ෂුද්‍ර ජීව විද්‍යා, microbiology, පටක ශෛල විද්‍යාව, Histopthology නියෝජනය කරමින් ඉහත කේෂත්‍රයන්හි වෛද්‍ය රසායානාගාරවල නිරත පුද්ගලයින් හා වෛද්‍ය පරීක්ෂණ වර්ගීකරණය ඔවුන්ගේ මූලික කණ්ඩායම් යටතේ හුරුපුරුදු පරීක්ෂණ, විශේෂ පරීක්ෂණ, අතිවිශේෂ පරීක්ෂණ සේවා දීර්ග කිරීම සිදුකරන ලදී.<br>ISO 15189 පදනම්කරගෙන වෛද්‍ය/චිකිත්සක රසායනාගාර 9 ක් සඳහා ප්‍රතීතනය පිරිනමන ලදී. තවත් වෛද්‍ය රසායනාගාර 5 ක් සඳහා අයදුම්පත් ලැබී ඇති අතර ඒවාට ප්‍රතීතනය පිරිනැමීම සඳහා අවසන් ක්‍රියාවලිය සිදුකර ඇත. ඒසේම පූර්ව තක්සේරු 4 ක් , සුපරීක්ෂණ තක්සේරු 03 ක්ද, නැවත තක්සේරු 4 ක් හා මූලික තක්සේරු 6 ක්ද සිදුකරන ලදී. | |
| **සහතික කිරීමේ ආයතන ප්‍රතීතනය කිරීම** | පද්ධතිවල හා නිමයුම් සහතිකකරනයේදී ප්‍රතීතනය ලත් සහතික සෘජුවම දේශීය හා විදේශීය වෙළඳාමට සහාය වන බැවින් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ සහතික කිරීම සඳහා වන ප්‍රතීතන සැලසුම් තවත් උපායමාර්ගික වපසරියක් ලෙස ඉහල සැලකිල්ලට භාජනය කර ඇත. 2011 වර්ෂයේදීද ප්‍රතීතන සැලසුම් පද්ධති සහතික කිරීමේ ආයතන සඳහා වන ISO 17021 හා ISO /IEC : මඟපෙන්වීම් 65 සඳහා වන ප්‍රතීතන සැලසුම් ක්‍රියාවට නන්වා ඇත.<br>මේ සඳහා අයදුම්පත් 4 ක් වෙනුවෙන් ප්‍රතීතනය පිරිනැමීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත. වර්ෂය තුල ප්‍රතීතන 3 ක් ද පිරිනමන ලදී. ඊට අමතරව එක් පූර්ව තක්සේරුවක්, සුපරීක්ෂක, තත්ව කළමනාකරණ ක්‍රමවේද, පරිසර කළමනාකරණ ක්‍රමවේද, ආහාර සුරක්ෂිත කළමනාකරණ ක්‍රමවේද හා නිෂ්පාදන ක්ෂේත්‍ර ආවරණය කර ඇත. | |

| | |
|---|---|
| **පිරික්සුම් ආයතන සඳහා වන ප්‍රතීතනය** | ප්‍රතීතනය ලත් සුපරීක්ෂණය සඳහා වන ආයතන මගින් අනුකූලතා තක්සේරු සේවා සැපයීම මනාව සිදුවේද යන්න නීතිරීති සම්පාදනය කරනු ලබන නියාමන ආයතන විසින් බලාපොරොත්තු වේ. සහතික ලත් ප්‍රතීතන ආයතනවල භාවිතය සඳහා වන ප්‍රවර්ධන වැඩසටහන් නියාමන ආයතන මඟින් වර්ෂය තුලදී සිදුකරන ලදී. සුපරීක්ෂණ ආයතන ආවරණය ISO /IEC : 17020 පදනම්කරගත් නීතිරීති හා ක්‍රමවේද දියත් කිරීම ආරම්භ කර ඇත. එසේම ආහාර සුපරීක්ෂණය හා වාහන සුපරීක්ෂණය සඳහා වන නියත මිනුම්දඬු සැකසීමද සිදුවෙමින් පවතී. |
| **රසායනාගාර සඳහා වන යහපාලනය ප්‍රතීතනය** | පර්යේෂණ හා සංවර්ධනය සඳහා වන රසායනාගාර හා විශ්වවිද්‍යාල රසායනාගාර වලින් සිදුකරන පර්යේෂණ සහ ක්‍රමවේද ප්‍රවර්ධන වැඩකටයුතු සඳහා සාදරණ ඉල්ලුමක් ඇති බැවින් ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය රසායනාගාර යහපාලනය සදහා ප්‍රතීතන වැඩසටහන් ස්ථාපිතකිරීම සඳහා කටයුතු සිදුකරමින් තිබුණි. අනෙක් අතට 2011/ 2015 විද්‍යා හා තක්ෂණ සහ නව නිපැයුම් උපායමාගී අනුව පර්යේෂණ හා සංවර්ධන රසායනාගාර සහ අනෙකුත් රායනාගාර සඳහා ප්‍රමිත ගත යටිතල පහසුකම් ස්ථාපිත කිරීම හා වැඩිදියුණු කිරීමේ වගකීම ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වෙත පැවරී ඇත. මේ සම්බන්ධයෙන් නව තාක්ෂණ උපදේශන කමිටු පිහිටවූ අතර එම උපදේශ කමිටු රසායනාගාර යහ පාලනය සම්බන්ද ජාතික ප්‍රමිත සකස්කිරීමේදී මැදිහත්වී කටයුතු කරන අතර ශ්‍රී ලංකා ප්‍රමිත ආයතනයේ සහභාගිත්වයද ලබාගනී. |
| **නිපුනතා පරීක්ෂණ වැඩසටහන්** | වෛද්‍ය පරීක්ෂණ ඇතුළු අනෙකුත් පරීක්ෂණ හා ක්‍රමාංකනයන්ට අදල ප්‍රතීතන සැලසුම්වල එක් වැදගත් අංගයක් වන්නේ බාහිර පාර්ශවයකින් සිදුකරන නිපුනතා පරීක්ෂණ හෝ රසායානාගාර අතර කරන ප්‍රථිඵල සැසඳීමේ ක්‍රියාවලිය තුලින් පරීක්ෂණ ප්‍රතිඵල වල තත්වය තහවුරු කිරීමටයි. යම් කටයුත්තක් වෙනුවෙන් පහසුකම් සලසන පරීක්ෂණ රසායනාගාර සඳහා නිපුනතා පරීක්ෂණ සිදුකරනු ලබන කාර්මික තාක්ෂණ ආයතනය (ITI) හා ශ්‍රී ලංකා ඇසෝසියේෂන් ඔෆ් ටෙස්ටින් ලැබෝරටීස් ආයතනය, Association of Testing Laboratories ජලයෙහි ඇති ක්ෂුද්‍රජීව විද්‍යාත්මක අධ්‍යයන හා තේ හා මාලුවල ආසාත්මිකතාවයට නිපුනතා පරීක්ෂණ ඉදිරියටක් සිදුකිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් පළිගැනීමට ලක් කර ඇත. ඊට අමතරව APLAC සාමාජිකත්වය ලද ආයතන හා වෙල්ලෝරේ ක්‍රිස්තියානි |

| | |
|---|---|
| | වෛද්‍යවිද්‍යාලය පිලිවලින් පරීක්ෂණ හා වෛද්‍ය රසායනාගාර සඳහා නිපුනතා පරීක්ෂණ සිදුකිරීමට වන ස්ථාන අනුව ඒවා සිදුකරනු ලබයි.<br><br>පරීක්ෂණ හා ක්‍රමාංකනය සඳහා නිපුනතා පරීක්ෂණ වන රසායනාගාර අතර ප්‍රතිපල සැසඳීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පිළිවෙලින් සෞඛ්‍ය අමාත්‍යාංශය හා කිරුම් මිනුම් සේවා හා ප්‍රමිත දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා පවත්වන ලදී. |
| 2011<br>**කාර්ය සාදනය** | 2011 ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ පස්වන මෙහෙයුම් වර්ෂයයි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයට පරීක්ෂණ හා ක්‍රමාංකන රසායනාගාර වෛද්‍ය රසායනාගාර හා සහතික කිරීමේ ආයතන වැඩි සංඛ්‍යාවකට ප්‍රතීතන සේවා ලබාදීමට හැකියාව ලැබී ඇත. මෙම ප්‍රතීතන වැඩපිලිවෙල කළමණාකරණය හා මෙහෙයවීම ජාත්‍යන්තර ප්‍රමිතිවලට හා ISO /IEC : 17011 ප්‍රතීතන ආයතනවලට අදාල වන ආකාරයට සිදුකෙරේ.<br><br>**ශ්‍රී ලංක ප්‍රතීතන මණ්ඩල කළමණාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම**<br>පැසිෆික් ප්‍රතීතන සංස්ථාව (PAC) සමඟ බහුපාර්ශවීය එකඟතාවය (PAC MLA) සඳහා ඇතුලත් වීමත් සමඟ තත්ව කළමණාකරණ පද්දති (QMS) පාරිසරික කමණාකරන පද්දති (EMS) සහතිකරණ හා නිෂ්පාදන සහතිකරණ පරාසයන් PAC හා IAF මගපෙන්වීම් පදනම්කරගෙන ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ කළමණාකරණ පද්ධතිය පුළුල් කිරීමට සිදුවිය. ඊට අමතරව ආසියා ශාන්තිකර රසායානාගාර ප්‍රතීතන සංස්ථාවේ (APLAC) /ජාත්‍යන්තර රසායනාගාර ප්‍රතීතන සහයෝගීතාවයේ අන්‍යෝන්‍ය පිලිගැනීමේ එකඟතාවය (APLAC/ILAC MRA) නියමයන්ට අනුව (APLAC/ILAC) මගපෙන්වීම් යටතේ තිබූ ලියවිලි ඉවත්කොට අලුතින් අවශ්‍ය ලියවිලි සමඟ අදල වෙනස්වීම් සිදුකරන ලදී.<br><br>ජීව විද්‍යාත්මක පරීක්ෂණ, යාන්ත්‍රික පරීක්ෂණ හා ක්‍රමාංකණය සඳහා වන නියත මිනුම් සැකසීම නිමකර ඇති අතර වෛද්‍ය පරීක්ෂණ හා රසායනික පරීක්ෂණ වෙනස් කරමින් පැවතුනි. ආහාර සුපරීක්ෂණය, වාහන දුම් පරීක්ෂණ, තේ නිෂ්පාදන සහතිකකරණය, QMS සහතිකකරණය, EMS සහතිකකරණය, හා GLP සහතිකකරණය, වැඩිදියුණු කරමින් තිබුනි. |

| | |
|---|---|
| | **ප්‍රතීතන සේවාව**<br><br>වර්ෂ 2011 දී ප්‍රතීතනය කරන ලද පරීක්ෂණ රසයනාගාර 7 ක්ද වෛද්‍ය/ චිකිත්සක රසායනාගාර 04 ක් ද ප්‍රතීතනය කරන ලද රසයානාගාර ගණනට එකතු විය. අනෙක් අතට FSMS, EMS හා නිෂ්පාදන යටතේ සහතික කිරීමේ ආයතන හතරක් සඳහා ප්‍රතීතන පිරිනමන ලදී. ඊට අමරව පරීක්ෂණ 24 ක් හා ක්‍රමාංකන 3 ක් පරීක්ෂන ක්‍රමාංකන රසයානාගර හා වෛද්‍ය/ චිකිත්සක පරීක්ෂණ රසයානාගාර සඳහා සුපරීක්ෂණ පරීක්ෂණ සිදු කරන ලදී. එසේම සහතික කරන ආයතන සඳහා සුපරීක්ෂණ පරීක්ෂණ සංඛ්‍යාව 03 කි. මුලික තක්සේරු හා නැවත තක්සේරු කිරීම් එකතුව ගත් කළ පරීක්ෂණ රසයානාගාර සඳහා දහතක්ද (17) වෛද්‍ය රසයානාගාර 06 ක් සඳහා සිදු කරන ලදී.<br><br>වර්ෂ අවසාන වන විට ප්‍රතීතනය කරන ලද පරීක්ෂණ රසයානාගාර (වෛද්‍ය නොවන) තිස් හතක් ද වෛද්‍ය රසයනාගාර 09 ක්ද සහතික කිරීමේ ආයතන 4 ක්ද වේ.<br><br>ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය ජාත්‍යන්තර රසයානාගර ප්‍රතීතන සංස්ථාවේ අන්නෝන්‍යය පිළිගැනීම සඳහා වන ගිවිසුමට (ILAC / MRA) ඇතුලත් වන ලදී.<br><br>2009 වර්ෂයේදී ISO 15189 ඇතුළත්ව පරීක්ෂණ සඳහා රසයානාගාර ප්‍රතීතන ක්‍රමවේද ඒවා කළමණාකරණය හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ඇගයීමක් APLAC ආයතනයේ කණ්ඩායමක් විසින් සිදු කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය, ජාත්‍යන්තර රසයනාගාර ප්‍රතීතන සංස්ථාවේ අන්නෝන්‍යය පිළිගැනීම සඳහා වන ගිවිසුමට (ILAC / MRA) ඇතුලත් වන ලදී. වර්ෂ 2011 දී ක්‍රමාංකන සඳහා මුලික පරීක්ෂණය ඇතුළු වෛද්‍ය පරීක්ෂණය සඳහා නැවත ඇගයීමක්ද APLAC ආයතනයේ කණ්ඩායම විසින් සිදු කරන ලදී. |
| **ජාත්‍යන්තර ජයග්‍රහණය හා සිදුවීම්** | ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය, ආසියා ජාත්‍යන්තර රසයනාගාර ප්‍රතීතන සංස්ථාවේ APLAC හා ජාත්‍යන්තර රසයනාගාර ප්‍රතීතන සංස්ථවේ (ILAC) පූර්ණ සාමාජිකත්වය ලබාගෙන ඇත. ILAC හා APLAC අන්‍යෝන්‍ය පිළිගැනීම් සඳහා වූ ගිවිසුම එකගතා තත්වයට MRA ශ්‍රී |

| | |
|---|---|
| | ලංකා ප්‍රතීතන මණ්ඩලය 2009 වර්ෂයේදී ඇතුලත්කරගත් අතර එම තත්වය 2011 ඉදිරියටද පවත්වාගෙන ඇත. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ක්‍රමාංකනය සඳහාවූ APLAC හා ILAC ,MRA තත්වයට ඇතුළත් කිරිම සඳහා 2011 වර්ෂයේදී APLAC ආයතනය ඇගයීමක් සිදු කරන ලදී.<br>ඊට අමතරව ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය, පැසිපික් ප්‍රතීතන සංස්ථාවේ PAC පූර්ණ සමාජික තත්තවය ලබා ගත් අතර අන්නෝන්‍ය පිළිගැනීම සඳහා වන ගිවිසුම් ගත තත්වයට (MRA) ඇතුලත් වීම සඳහා සියුම් ලෙස කරන ඇගයීම සඳහා අයදුම් කර ඇත. එසේම ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය, ජාත්‍යන්තර ප්‍රතීතන සංසදයේ IAF පූර්ණ සමාජිකත්වය 2011 වර්ෂයේදී ඉල්ලුම් කර ඇත.<br><br>ජර්මනියේ PTB ආයතනය හා විදේශ අමාත්‍යංශයේ ඉල්ලීම පරිදි ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මගින් කලාපීය පුහුණු වැඩ මුළුවක් 2011 දෙසැම්බර් 14/16 කාලය තුළ කොළඹ දී පවත්න ලදී. මෙම වැඩමුළුව SAARC - PTB තාක්ෂණ සහායක වැඩ මුළුව යටතේ හා ISO / IEC 17021 හා ISO / IEC මඟපෙන්වීම් 65 පාදක කරගෙන සිදු කරන ලදී. මේ සඳහා සංවිධාන කටයුතු හා සංග්‍රහ දයකත්වය ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය සිදු කරන ලදී. මෙම වැඩසටහන් සඳහා සාක් කලාපීය රටවලින් 19 ක් සහභාගි වු අතර ටී.වික්‍රමසිංහ මහතා එක් පුහුණු සේවාදයකයෙකු ලෙස කටයුතු කරන ලදී. |
| **හැකියා වර්ධනය හා පුහුණු වැඩසටහන් පැවැත්වීම** | |
| | අදළ ප්‍රතීතන ප්‍රමිත හා මූල ධර්ම වලට අනුවයමින් ගුණාත්මක ප්‍රතීතන තේමා පදනම් කරගත් දැනුවත් කිරීමේ පුහුණු වැඩ සටහන් හා සම්න්ත්‍රණ අනුකූලතා තක්සේරු ආයතන සඳහා (රසයානාගාර, සහතික කිරිමේ ආයතන හා පරීක්ෂණ ආයතන) ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය නිරතුරුවම වැඩසටහන් දියත් කරමින් පවති. 2011 වර්ෂයේදී පුහුණු කිරිමේ වැඩ සටහන් 10 ක් හා සම්මන්ත්‍රණ 06 ක් සිදු කරන ලදී.<br><br>ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මගින් ISO 15189 පදනම් කරගත් වෛද්‍ය රසායනාගාර ක්ෂේත්‍රයේ තක්සේරු කරුවන් පුහුණු කිරිමේ වැඩ සටහනක් හා ISO / IEC 17021 හා ISO / IEC මඟපෙන්වීම් 65 පදනම් කරගත් සහතික කිරිමේ ආයතන ක්ෂේත්‍රයේ තක්සේරු කරුවන් පුහුණු |

| | |
|---|---|
